# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1597 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024 திகதி

දිනය / Date — 17/10/2024 පැය 1730

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**ඇමරිකානු තානාපති කාර්යාලයේ අනුග්‍රහය යටතේ පවත්වන ලද "Scene of Crime Officer Training course (Intermediate & advanced)" පාඨමාලාවේ සමාප්ති උළෙල**

ශ්‍රී ලංකා ඇමරිකානු තානාපති කාර්යාලයේ පූර්ණ අනුග්‍රහය මත 2024.02.19 වන දින සිට 2024.10.16 වන දින දක්වා අපරාධ ස්ථාන පරීක්ෂා කිරීමට අදාලව පුහුණු සැසි 05 ක් අපරාධ ස්ථාන පරීක්ෂණ (SOCO) නිලධාරීන් 95 දෙනෙකු සඳහා කළුතර පොලිස් විද්‍යාලයේදී පවත්වනු ලැබීය.

මෙම පාඨමාලාව නිලධාරීන් 57 දෙනෙකු සඳහා **Scene of Crime Officer Training course (Intermediate)** ලෙස පුහුණු සැසි වාර 03 ක් යටතේ 2024.02.19 වන දින සිට 2024.10.04 වන දින දක්වා පවත්වන ලද අතර නිලධාරීන් 38 දෙනෙකු සඳහා **Scene of Crime Officer Training course (advanced)** ලෙස පුහුණු සැසි වාර 02 ක් යටතේ 2024.10.05 වන දින සිට 2024.10.16 වන දින දක්වා පවත්වන ලදී.

පාඨමාලාවට සහභාගී වූ නිලධාරීන් සඳහා සහතිකපත් ප්‍රදානය කිරීම සහ නිල ලාංඡන පැළඳවීම ශ්‍රී ලංකා ඇමරිකානු තානාපති ජූලි චන්ග් මහත්මියගේ ප්‍රධානත්වයෙන් සහ වැඩබලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතාගේ සහභාගිත්වයෙන් 2024 ඔක්තෝම්බර් මස 17 වන අද දින අපරාධ වාර්තා කොට්ඨාස ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. එහිදී වැඩබලන පොලිස්පතිතුමා විසින් ඇමරිකානු තානාපතිතුමිය ඇතුලු පාඨමාලාවේ උපදේශකවරුන් වෙත සමරු තිළිණ ප්‍රදානයක්ද සිදු කරන ලදී.

මෙම අවස්ථාවට ඇමරිකානු තානාපති කාර්යාල නිලධාරීන්, පාඨමාලාවේ ඇමරිකානු උපදේශකවරුන්, පුහුණු හා උසස් පුහුණු කිරීම් දිසාව භාර ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සජීව මැදවත්ත, අපරාධ හා රථවාහන දිසාව භාර ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රන්මල් කොඩිතුවක්කු, අපරාධ දිසාව සහ පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ නිහාල් තල්දූව යන මහත්ම/මහත්මීන් ඇතුළු ජොෂ්ඨ පොලිස් නිලධාරීන්, කොට්ඨාස අපරාධ ස්ථාන පරීක්ෂණාගාර නිලධාරීන් හා අපරාධ විමර්ශන ක්ෂේත්‍රයට සම්බන්ධ පොලිස් නිලධාරීන් පිරිසක් සහභාගී විය.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක් මේ සමඟ ඔබ වෙත යොමු කරවමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**